# සූර්ය වර්ෂ හා චන්ද්‍රත වර්ෂ ගණනය.

[ සිංහල – Sinhala – سنهالي ]

මාහිර් රම්ඩීන්

2013 - 1435

IslamHouse.com

# التقويم الهجري والميلادي

« باللغة السنهالية »

ماهر رمدين

2013 - 1435

IslamHouse.com

# සූර්ය වර්ෂ හා චන්ද්‍ර වර්ෂ ගණනය.

සියලු ප්‍රශංසා අල්ලාහ් සතුය. ශාන්තිය හා සමාදානය උත්තම නායක මුහම්මද් (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණන් හා එතුමාණන්ගේ පවුලේ ඥාතීන් වෙත හිමි වේවා !

සූර්ය වර්ෂ ගණන් ගනු ලබනුයේ හිරුගේ ක්‍රියාකාරීත්වයෙනුල් කර ගනිමිනි. නමුත් එය දෑසින් දුටු පමණින් එහි මාස ගණන් නියම කිරීමට අපහසුය. චන්ද්‍ර වර්ෂ ගණනයේ දී පෘථිවිය වටා චන්ද්‍රගයාගේ ගමන් මාර්ගය අනුව එහි පවතින වෙනස් වීම් අනුව ගණන් ගැනීම ඉතා පහසුය . චන්ද්‍රනයාගේ විවිධ ප්‍රගමාණයන් දෑසින්ම දැක බලා දින ගණන් හා මාස ගණන් ගණන් ගත හැක. එහී දී නව සඳ අඩ සඳ පසුව පසළොස්වක යනුවෙන් විවිධාකාර හැඩතලයන්ගෙන් වර්ධනය වී ඒ අයුරින්ම ක්‍රවම ක්‍රමයෙන් බැස යෑම දැකිය හැක. අවසානයේ එය මැකී යයි. ඉන් පසුව නැවත නව සඳ උදා වෙයි. මේ අයුරින් දින මාස වර් ෂ ගණන් ගැනීමට පහසුය. එමෙන්ම චන්ද්‍රෑ වසර ගණනයේ දී තාරකා ශාස්ත්‍ර කුළින් පමණක් නොව පොදු ජනයාට පවා එය

දෑසින් දැක බලා දින ගණන් මාස ගණන් බලා ගත හැක. මේ හේතුව මත අරාබිවරු චන්ද්‍රා වර්ෂ ගණන් බැලීමට ආරම්භ කළහ. ඒ අනුව ඔවුන්ගේ කටයුතු සිදු කිරීමට ද ඔවුන්ගේ උත්සවයන් හා විශේෂ සිද්ධීන් දින ගණන් බලා නියම කිරීමට ද හැකි විය. ලෞකික මෙන්ම ආගමික කටයුතු බොහෝමයක් මේ අනුව ක්‍රියාත්මක කිරීමට ද හැකි විය. අල්ලාහ් අල්-කුර්ආනයේ මෙසේ සඳහන් කරයි.

يَسْأَلُونَكَ عَنِ الْأَهِلَّةِ قُلْ هِيَ مَوَاقِيتُ لِلنَّاسِ وَالْحَجِّ وَلَيْسَ الْبِرُّ بِأَنْ تَأْتُوا الْبُيُوتَ مِنْ ظُهُورِهَا وَلَكِنَّ الْبِرَّ مَنِ اتَّقَى وَأْتُوا الْبُيُوتَ مِنْ أَبْوَابِهَا وَاتَّقُوا اللَّهَ لَعَلَّكُمْ تُفْلِحُونَ

(නබිවරය) නුඹගෙන් නව සඳ පිළිබඳව ඔවුහු විමසති. එය ජනයා සඳහා ද හජ් (වතාවන්) සඳහා ද වූ කාල නියමයන් යැයි පවසවු. නිවසට එහි පිටුපසින් පිවිසීම යහකමක් නොවේ. එහෙත් යහකම ඇත්තේ බිය භක්තිය ඇත්තන්ටය. නිවසට එහි ඉදිරි දොරටු තුළින් පිවිසෙවු. නුඹලා ජය ලබා ගනු පිණිස අල්ලාහ්ට බිය භක්තිමත් වවු. (අල්-කුර්ආන් 2:189)

ඉන්පසුව මෙම ආයතය පහළ විය.

إِنَّ عِدَّةَ الشُّهُورِ عِنْدَ اللَّهِ اثْنَا عَشَرَ شَهْرًا فِي كِتَابِ اللَّهِ
يَوْمَ خَلَقَ السَّمَاوَاتِ وَالْأَرْضَ مِنْهَا أَرْبَعَةٌ حُرُمٌ

අල්ලාහ්ගේ ලේඛනයෙහි ඇති පරිදි අහස් හා මිහිතලය මැවූ දින සිට සැබැවින්ම මාස ගණන අල්ලාහ් අබියස මාස දොළොසකි. ඒවායින් ශුද්ධ වූ මාස හතරකි. (අල්-කුර්ආන් 9:36)

මෙයාකාරයෙන් මෙම ආයතය චන්ද්‍රනයාගේ උදාව මුල් කර ගෙන චන්ද්‍රෙ වර්ෂ කාලය සීමා කර ඇත. එනම් එය මාස දොළොසක් වශයෙනි. අරාබිවරු හා මුස්ලිම්වරු ජීවත් වන සෑම ප්‍රාදේශයකම මේ අනුව ගණන් බලා ලෞකික හා විශේෂයෙන් ආගමික කටයුතු මෙහෙයවති.

## වර්ෂ ගණනය හා දින ගණනය.

අල්-කුර්ආනය පාරායනය කරන විට ඇතැම් ගැඹුරු අර්ථවත් වදන් අප පසු කරමින් යන්නෙමු. නමුත් අපි එහි අන්තර්ගත ගැඹුරු අදහස දෙස අවධානය

යොමු නොකරන්නෙමු. අල්-කුර්ආන් 10:5 වන වැකියේ මෙසේ සඳහන් වෙයි.

هُوَ الَّذِي جَعَلَ الشَّمْسَ ضِيَاءً وَالْقَمَرَ نُورًا وَقَدَّرَهُ مَنَازِلَ لِتَعْلَمُوا عَدَدَ السِّنِينَ وَالْحِسَابَ مَا خَلَقَ اللهُ ذَلِكَ إِلَّا بِالْحَقِّ يُفَصِّلُ الْآَيَاتِ لِقَوْمٍ يَعْلَمُونَ

වර්ෂ සංඛ්‍යාවව හා (කාල) ගණනය නුඹලා දැන ගනු පිණිස සූර්යයා ආලෝකය ලබා දෙන්නක් වශයෙන් ද චන්ද්‍රයා ආලෝකය විහිදුවන්නක් වශයෙන් ද ඇති කර තවද එයට (චන්ද්‍රඳයාට හිමි) ස්ථාන නියම කළේ ඔහුය. මෙය අල්ලාහ් සත්‍යරයන් යුතුව මිස නොමැව්වේය. දැනමුතුකම් ඇති ජනයාට ඔහු සාධක පැහැදිලි කරන්නේය. (අල්-කුර්ආන් 10:5)

තවදුරටත් දැනුවත් කරමින් අල්-කුර්ආන් 17:12 වැනි වැකිය මෙසේ අවධාරණය කරයි.

وَجَعَلْنَا اللَّيْلَ وَالنَّهَارَ آَيَتَيْنِ فَمَحَوْنَا آَيَةَ اللَّيْلِ وَجَعَلْنَا آَيَةَ النَّهَارِ مُبْصِرَةً لِتَبْتَغُوا فَضْلًا مِنْ رَبِّكُمْ وَلِتَعْلَمُوا عَدَدَ السِّنِينَ وَالْحِسَابَ وَكُلَّ شَيْءٍ فَصَّلْنَاهُ تَفْصِيلًا

රාත්රි□ය හා දහවල අපි සංඥා දෙකක් බවට පත් කළෙමු. නුඹලාගේ පරමාධිපතිගෙන් වූ භාග්ය ය සෙවීමටත් වර්ෂ සංඛ්යාමව හා (කාල) ගණනය නුඹලා දැන ගනු පිණිසත් රාත්රිබ යෙහි සංඥාව අප මකා දහවලේ සංඥාව පෙනෙන්නක් බවට පත් කළෙමු. තවද සෑම දෙයක්ම අපි පැහැදිලි ලෙස විග්රෙහ කර ඇත්තෙමු. (අල්-කුර්ආන් 17:12)

මෙම වාක්යෙය දෙක අතර විශාල වෙනසක් දැකිය හැක. හේතුව අල්-කුර්ආන් 10:5 වැනි වැකිය චන්ද්රහයා කේන්ද්රල කර ගනිමින් වර්ෂ සංඛ්යා්ව හා කාල ගණනය චන්ද්රමයාගේ පැවැත්ම අනුව තීන්දු කෙරේ යැයි සඳහන් වී ඇත. තාරකා විද්යාුවට අනුව චන්ද්ර් මාසයක කාලය නිර්ණය වනුයේ දින 29 යි පැය 12යි විනාඩි 44යි තප්පර 2.8 ක් වැනි කාලයක් වශයෙනි. අනතුරුව වර්ෂ ගණනය චන්ද්රේ මාස ගණනය අනුව සංඛ්යා.නුගත කරන ලදී. අරාබිවරු භාවිත කළ වර්ෂ ගණනය මෙලෙස පිහිටිණ. පසු කාලයේ හිජ්රි වර්ෂ ගණනය ද ගණන් ගනු ලැබුවේ මේ ක්රරමයට අනුවය.

නමුත් අල්-කුර්ආන් 17:12 වැනි ආයතය ඊට හාත් පසින්ම වෙනස් අදහසක් දරයි. එනම් හිරුගේ ක්රි යාකාරිත්වය මුල් කර ගෙන රාත්රිරයට පසු දහවල පසු පසින්

පැමිණෙන බව පවසා පසුව සූර්යය ගණන් අනුව වසර ගණන් ගැනීම පිළිබඳව අවධාරණය කර ඇත. එය රෝම වරුන්ගේ යුගයේ පටන් මිනිසා කාලය ගණන් බැලූ ක්‍රමයයි. නමුත් අහසේ දිස්වන චන්ද්‍රකයාගේ විවිධාකාර හැඩතලයන් මුල් කර ගනිමින් දින ගණන් තීරණය කරනවාක් මෙන් සූර්ය ගණනය අනුව දින හා මාස තීරණය කිරීම අපහසු කාර්යයකි. එය නිවැරදිද නොවෙයි. නමුත් පුරාණ කාලයේ සිටම කාල ප්‍රභේද වෙන් කර හඳුනා ගැනීමේ හැකියාව ඔවුනට තිබිණ. එසේ වෙන් කර ගත් එක් ප්‍රකභේදයක සීමා කාලය මාස හතරක් ලෙස ගණන් ගැණිනි. එසේ ගණන් ගනු ලැබුවේ අහසේ දිස්වන හිරුගේ ස්ථානගත වීමේ ක්‍රියාකාරීත්වය මුල් කරගෙනය.

සූර්ය වර්ෂයක් ආරම්භ වනුයේ මාර්තු 21 වැනි දින හිරු උතුරු අර්ධ ගෝලයට උදාවීමත් සමඟය. ඒ සමඟම එම ප්‍රදේශයට වසන්ත ඍතුව උදා වෙයි. එවිට කර්කටක නිවර්තනයට ගිම්හාන ඍතුවත් දකුණු අර්ධ ගෝලයට සරත් ඍතුවත් මකර නිවර්තනයට සිසිර ඍතුවත් උදා වෙයි. අනතුරුව මාස තුනකින් පසුව එනම් ජූනි 21 දින හිරුගේ ස්ථානගත වීම කර්කටක නිවර්තනයට මාරු වී එහි මුදුණින් පිහිටෙයි. එමෙන්ම

සැප්තැම්බර් 23 හිරුගේ මුදුන් වීම දකුණු අර්ධ ගෝලයෙහි ද දෙසැම්බර් 23 මකර නිවර්තනයෙහි ද දැකිය හැක. අවසානයේ නැවතත් හිරු උතුරු අර්ධ ගොලයට මුදුණින් පිහිටෙයි. එ සමඟම සූර්ය වර්ෂයක නිමාව දැකිය හැක.

මෙයාකාරයෙන් චන්ද්‍රන වර්ෂ හා සූර්ය වර්ෂ අතර වූ වෙනස ඉස්මතු කරමින් ඉහත කී දේව වදන් දෙක වෙන වෙනම පැහැදිලි කර තිබීම අපට දැකිය හැකිය. එමෙන්ම මේ වෙනස සූරතුල් කහ්ෆ් හෙවත් 18 වැනි පරිච්ඡේදයේ 25 වැනි වැකියෙහි එකවර පවසා ඇත.

එනම්

وَلَبِثُوا فِي كَهْفِهِمْ ثَلَاثَ مِئَةٍ سِنِينَ وَازْدَادُوا تِسْعًا

ඔවුන් ඔවුන්ගේ ලෙනෙහි වසර තුන් සියයක් රැඳී සිටියෝය. තවත් (වසර) නවයක් අධික කර ගත්තෝය.

## සූර්ය හා චන්ද්‍රෙ වර්ෂ ගණනය අතර වෙනස

සෑම දිනකම අප දකින්නා වූ හිරුගේ ගමන බාහිර ලෙසින් දකින භ්‍රමණ ක්‍රියාවලියක් මිස සැබෑ භ්‍රතමණ ක්‍රිනයාවලියක් නොවේ. සැබෑ ලෙස භ්‍රමණය වනුයේ

මිහිතලයයි. එය හිරු වටා වසරක භ්‍රසමණ ක්‍රියාවලියේ දී දෛනික ගමන් මාර්ගය විවිධ ප්‍රාමාණයන්ට අනුව පිහිටා ඇති බව අප දැන ගත යුතුයි.

එමෙන්ම අප දකින්නා වූ චන්ද්‍රැයාගේ ගමන, භ්‍ර මණ ක්‍රි්යාවලියන් දෙකක් සතු කර ගනිමින් තම ක්‍රිියාවෙහි යෙදෙන බවත් එනම් පෘථිවිය වටා චන්ද්‍රරයා භ්‍රකමණය වීම හා පෘථිවිය ද තමන් වටා පරිභ්‍රමණය වීමය. මෙසේ චන්ද්‍රවයා හා පෘථිවියේ භ්‍රමමණ හා පරිභ්‍රෙමණ ක්‍රි යාවලියන් දෙකෙහි ප්‍රයතිඵලයක් ලෙස චන්ද්‍ර දින ගණන් බිහි වන බවත් මේ හේතුවෙන් සූර්ය දින ගණන චන්ද්‍රි දින ගණනට වඩා විනාඩි 42 සිට 68 දක්වා වූ කාලයකින් අධික බවත් අප දැන ගත යුතුයි. එමෙන්ම පෘථිවිය හිරු වටා එක් වරක් සම්පූර්ණයෙන් භ්‍රනමණය වීම සූර්ය වසරක් ලෙස හැඳින්වන බවත් දැන ගත යුතුයි. එය තාරකා විද්‍යාඥයින් විසින් සූර්ය වසරක් ලෙස ගණන් ගනු ලබනුයේ හිරුගේ බාහිර පැවැත්ම අනුවය. එනම් ඉහත කී පරිදි උතුරු අර්ධ ගෝලයේ හිරු මුදුන් වී පසුව හිරුගේ ස්ථානගත වීම් අනුව සෘතු උදාවීම සැලකිල්ලට ගනිමිනි.

මේ සඳහා ගත වන පූර්ණ කාලය දින 365 යි පැය 5යි විනාඩි 48 තප්පර 46 ක කාලයකි. එය දශම

ස්ථානයෙන් දක්වන්නේ නම් 36    5.242217කි. මේ දශම ප්‍රාමාණය දින කාලකට වඩා අඩු කාලයකි. එබැවින් ලීප් වසරක් අධිකව පැමිණෙයි. සෑම වසර 4 කට වරක් එක් දිනක් වැඩි වෙයි.

චන්ද්‍රව වර්ෂය : එහි කාල සීමාව දින 354.367017කි. මෙම කාලය චන්ද්‍රවයා පෘථිවිය වටා වාර 12 ගමන් කිරීමට ගත වන කාලයයි. එය චන්ද්‍රීයාගේ භ්‍ර5මණයෙහි වාර ගණන් අනුව බෙදී කාලය ගණන් ගනු ලැබේ.

සූර්ය වර්ෂ හා චන්ද්‍රග වර්ෂ අතර වෙනස ගණන් කර බැලීමේ දී එය දින 10.87515 ක වෙනසක් පවතී. සූර්ය වර්ෂ හා චන්ද්‍රි වර්ෂ අතර වෙනස වසර සියයකින් සසදා බලන්නේ නම් එය දින 1087.515ක වෙනසකි. එනම් වසර තුනකි. වසර තුන්සියයකට ගණන් බලන්නේ නම් එය වසර 9ක වෙනසක් ගනු ඇත.

තාරකා විද්‍යාකඥයින් මවිතයට පත් කරමින් අල්-කුර්ආනයේ 18 වැනි පරිච්චේදය 25 වැනි වැකිය පිහිටා ඇත. එය මෙසේ විය

وَلَبِثُوا فِي كَهْفِهِمْ ثَلَاثَ مِئَةٍ سِنِينَ وَازْدَادُوا تِسْعًا

ඔවුන් ඔවුන්ගේ ලෙනෙහි වසර තුන් සියයක් රැඳී සිටියෝය. තවත් (වසර) නවයක් අධික කර ගත්තෝය.

මෙහි දී සූර්ය වර්ෂය අනුව ලෙන් වැසියන් ලෙනෙහි රැඳී සිටියේ වර්ෂ 300ක කාලයකි. නමුත් චන්ද්රර වර්ෂය අනුව ඔවුන් රැඳී සිටි කාලය වර්ෂ අවුරුදු 309කි. චන්ද්රය වර්ෂයක් සූර්ය වර්ෂයට වඩා දින 11 කින් අඩුය දින 11 වර්ෂ 300කින් ගුණ කර එය 365න් බෙදූ විට ලැබෙන පිළිතුර වර්ෂ 9කි.

මෙම ආයතය අවුරුදු 1400කට පෙර පහළ වූ වැකියකි. අල්-කුර්ආනය සාධක ඉදිරිපත් කරමින් මිනිසා සමග කතා කරමින් එහි විශිෂ්ට භාවය දන්වා සිටියි.

මෙය කුර්ආනයේ සඳහන් ගණිතමය ආශ්චර්යයක් පමණක් නොව වර්තමානයේ දේව ප්ර තික්ෂේපකයින් ඉදිරියේ මුහම්මද් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණෝ හිරු සඳු ග්ර හ තරු හා සියලු දෑ මැවූ අල්ලාහ්ගෙන් හැදෑරූ ග්රවන්ථයක් බව සනාථ කිරීමකි. අනු ප්රගමාණයටත් වඩා අල්ප දෑ ද අති විශාල වස්තූන් ද මැව්වේ ඔහුමය. ඔහු අති උත්තරීතරය. ග්රාහයන් නිසි අයුරින් ගමන් කරවනුයේ ද විශ්වය ක්ර මානු කූලව ක්රිියාත්මක කරනුයේ ද ඔහුමය.

නමුත් අවාසනාවකට වර්තමානයේ වියතුන් විසින් ලිවීමට කියවීමට නොහැකි ගණිත විද්යා ව හෝ

ඉංජිනේරු විද්‍යානව හෝ තාරකා විද්‍යා්ව හෝ නොහැදෑරූ නබිවරයාට සෑම වසර 300කටම වසර නවයක් එකතු වන බව වූ දැනුම පැමිණියේ කොහෙන්දැයි යන වග ගුප්ත කරුණක් වී ඇත. මෙයට පිළිතුරු දීමට නොහැකි දේව ප්‍රතික්ෂේපකයෝ නිහඬව පසුවෙති. ඔවුන් මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දින තෙක් මෙම අඥාන භාවයේ ගිලී සිටිති.

## අල්-කුර්ආනයේ ගණිතමය දැක්ම.

පුද්ගලයෙකු උමර් ඉබ්නු කත්තාබ් (රළියල්ලාහ් අන්හු) තුමාණන් වෙත තම බිරියට ᶻසිනාවෙහි හද්දු (අයථා ලිංගික සම්බන්ධතා සඳහා නියම වන දඬුවම) ඉටු කරන මෙන් ඉදිරිපත් කළේය. ඔහු ඇයව විවාහ කර ගත්තේ මාස හයකට උඩ දී කන්‍යා වක් වශයෙනි. නමුත් ඇය දරුවෙකු ප්‍ර සූත කළාය. මාස නවයකට පෙර පූර්ණ දරු ප්‍රරසූතියක් සිදුවීම පිළිබඳව දැනුම ආරබි වරුන් අතර නොවීය. පසුව උමර් (රළියල්ලාහු අන්හු) තුමාණන් විශේෂයෙන් මෙම කරුණ පිළිබඳව සාකච්ඡාමය තීන්දුවක් ලබා ගැනීම පිණිස කල් දමන මෙන් එම පුද්ගලයාගෙන් ඉල්ලා සිටියහ. සැබැවින්ම ᶻසිනාවෙහි හද් අල්ලාහ්ගේ හද් හෙවත් සීමාවන්

අතුරිනි. නමුත් මෙම තීන්දුවේ සාක්ෂියෙහි කොන්දේසි පූර්ණවත් නොවී තිබිණ. දරුවෙකු බිහි වීමට නියමිත කාලයට මාස තුනකට පෙර බිහි වීම පිළිබඳව කිසිදු සාධකයක් නොමැත.

පසුව උමර් (රළියල්ලාහු අන්හු) තුමාණන් මේ ප්‍රතශ්නය ඥානයේ දොරටුව වන අලී ඉබ්නු අබී තාලිබ් (කර්රමල්ලාහු වජ්හහූ) වෙත යොමු කළේය. නබි තුමාණන්ගේ ප්‍රහකාශය පරිදි මම ඥානයේ නගරයයි. එහි දොරටවු අලීය යැයි කළ ප්‍රරකාශයට අනුව එසේ සිදු විය.

අලී (රළියල්ලාහු අන්හු) තුමාණන්ගෙන් තීන්දුව නිකුත් විය. මෙම කාන්තාව පූර්ණ ලෙස දකිමින් මාස හයක පූර්ණ දරුවෙකු ප්‍රෙසූත කර ඇත්තාහ. එය පහත සඳහන් කුර්ආන් වැකි දෙක සාධක වශයෙන් ඉදිරිපත් කරමිනි.

حَمَلَتْهُ أُمُّهُ كُرْهًا وَوَضَعَتْهُ كُرْهًا وَحَمْلُهُ وَفِصَالُهُ ثَلَاثُونَ شَهْرًا

තවද ඔහුගේ මව ඉතා අසීරුවෙන් ඔහුව (ගැබ තුළ) ඉසිලුවාය. තවද ඉතා අසීරුවෙන් ඔහුව ප්‍රළසූත කළාය. ඔහුව (මව් කුසේ) ඉසිලීම හා ඔහුට කිරි පොවා (එය)

නතර කිරීම(ට අයත් කාලය) මාස තිහකි.

(අහ්කාෆ් 46:15)

وَوَصَّيْنَا الْإِنْسَانَ بِوَالِدَيْهِ حَمَلَتْهُ أُمُّهُ وَهْنًا عَلَى وَهْنٍ وَفِصَالُهُ فِي عَامَيْنِ أَنِ اشْكُرْ لِي وَلِوَالِدَيْكَ إِلَيَّ الْمَصِيرُ

මිනිසාට තම දෙමව්පියන් පිළිබඳව අපි අවවාද කළෙමු. ඔහුව ඔහුගේ මව දුෂ්කරතාව පිට දුෂ්කරතාවේ ඉසිලුවාය. ඔහුට කිරි පෙවීමේ කාලය වසර දෙකකි. (එබැවින්) මට ද ඔබේ දෙමව්පියන්ට ද කෘතඥ වවු. නැවත යොමු වන ස්ථානය ඇත්තේ මා වෙතමය.

(ලුක්මාන් 31:14)

(මුල් ආයතයෙහි සඳහන් පරිදි මව් කුසේ වැඩීමට හා කිරි පෙරවීමට ගත වන කාලය සඳහන් කර ඇත්තේ මාස තිහක් ලෙසිනි. දෙවන ආයතයේ කිරි පෙවීම පමණක් වසර දෙකක් එනම් මාස 24ක් යැයි සඳහන් වී ඇත. මාස 30න් මාස විසි හතරක් අඩු වූ විට ලැබෙන පිළිතුර මාස හයකි. එනම් දරුවා මව් කුස තුළ රැඳුනු කාලය මාස 6ක් ලෙස අර්ථවත් වන්නේය. එය ගැබ් ගත් තත්ත්වයෙහි අවම කාලයයි.)

ගැබ් ගත් මාස හයකින් පසු පූර්ණ දරුවෙකු ප්ර)සූත කිරීමට මවකට හැකියාව ඇති බව මෙම ආයත දෙකින් පෙන්වා දී අල්-කුර්ආනීය ගණන් විලාසය ඉදිරිපත් කරයි. මේ අයුරින් ᶻසිනාවෙහි හද් (අයථා ලිංගික සම්බන්ධතා වෙනුවෙන් වී දඬුවම) නියම වීම පිළිබඳව සැකයට තුඩු දුන් එම කාන්තාව නිර්දෝෂී බව තීන්දු විය. මෙලෙස අල්-කුර්ආනයේ ගණිතමය ක්රවමය විද්වතුන් හට ආලෝකයක් බවට පත් විය.

අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණන්ගේ කළ ප්රනකාශයක් මතක් කර දීම ඉතා අගනේය. එනම් කවරෙකු යහපත අපේක්ෂා කරන්නේ ද ඔහුට දහම පිළිබඳ අවබෝධය අල්ලාහ් පිරිනමනු ඇත. මේ අනුව අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණන් සත්ය(යම ප්රඅකාශ කර ඇත්තාහ.

දහම පිළිබඳව නිසි අවබෝධය අප සියලු දෙනාට
අල්ලාහ් පිරිනමත්වා !